


# දේව බලයෙන් ලෙඩ සුව කිරීමේ ප්‍රෝඩාව

**ආනන්ද ඔයා කොහේද අද ඉරිදා නිවාඩු දවසෙ මේ යන්න හදන්නෙ?**

**ඇයි ප්‍රියානි මතක නැද්ද මං ඔයාට කිව්වෙ.**

**අනේ මෙයා මට මතක නෑනෙ.**

**මං කිව්වෙ ආ රංගජීවගෙ ළමයගෙ වැඩේට යනව කියල මිනිහ හරි විශ්වාසෙන් ඉන්නෙ.**

**ඒයි අනේ මාත් එන්නද ඔයාලත් එක්ක.**

**ඒකට කමක් නෑ ඒත් වාහනේ ඉඩ මදිවුණොත් ඔයා රංගෙගෙ ගෙදර ඉන්න එයාගෙ අම්මයි, නංගියි ඉන්නවනෙ.**

ආනන්ද හා ප්‍රියානි රංගජීවගේ නිවසට යන විට උදේ අට හමාර පමණ විය. අද උදෙන්ම ඇවිල්ල, ඔහෙ පලයං මේ ප්‍රියානිත් ඇවිත් තියෙන්නෙ අමුත්තන් දුටු රංගජීව කීවේය. හා එමු එමු ගේ ඇතුළට. අමුත්තන් ගෙය තුළට කැඳවාගෙන ආ රංගජීව මේ දෙන්නට උදේට කන්න ලේස්ති කරන්න යැයි තම බිරිඳ යමුනාට කීවේය. කන්න ඕනෙ නැහැ අපි උදෙන්ම යමු නේද? ආනන්ද කීවත් සියලූම දෙනා ගියේ කෑම මේසය වෙතට ය.

රංගජීවත් ආනන්දත් එක්තරා ඇඟළුම් කර්මාන්ත ශාලාවක කළමනාකරුවෝ වෙති. රංගජීවට ඇවිදීමට නොහැකි දරුවෙක් සිටී. අත් පා නියමාකාරයෙන් පිහිටා තිබුණත් ඒවා හරිහැටි ක්‍රියාත්මක නොවේ. වෛද්‍යවරු කිහිප දෙනෙක් හමුවීමට ගොස් ප්‍රතිකාර ලබාගත්ත ද ඉන් පලක් වී නොමැත. පසුගිය සතියේ රංගජීවගේ නෙත ගැටුනේ අමුතුම තාලයේ පෝස්ටරයක් දෙසය. නාගරික රැස්වීම් ශාලාවේ පැවැත්වෙන විශේෂ දේව යාච්ඤාව මඟින් කොරුන් ඇවිද්දවීම, අන්ධයින්ට පෙනුම ලබාදීම, ගොළුවන් කතා කරවීම හා බිහිරන්ට ඇසීම ලබාදීම යන කරුණු ඉටු කරන බව එහි සඳහන් කොට තිබිණ. කිසිදු අයකිරීමකින් තොරව කෙරෙන මේ සත්කාර්යයට ආගම්, ජාති, කුලමල බේදයකින් තොරව සහභාගි විය හැකි බව ද පැමිණ සත්‍ය වටහා ගන්නා ලෙස ද එහි දක්වා තිබිණ.

ආනන්ද නගර ශාලාවේ රථ ගාල් කරන ස්ථානයේ තම මෝටර් රථය නැවැත්වීය. ආ බාධිත දරුවා වඩාගත් රංගජීව ඉස්සර විය. ප්‍රියානි හා යමුනා ඒ පිටුපසින් ගිය අතර ආනන්ද මෝටර් රථය අගුළු දමා පැමිණියේ ය. නගර ශාලාවට 150 ක් පමණ දෙනා රැස්ව සිටියහ. වේදිකාව ඉදිරිපස අසුන් පෙළෙහි ආබාධිතයන් හා ඔවුන්ගේ දෙමාපියන් භාරකාරයන් සිටි අතර නැරඹීමට පැමිණි අනෙකුත් අය පසුපස අසුන්වල සිටියහ. ප්‍රියානිට වාඩිවෙන ලෙස කී ආනන්ද යාබද අසුනෙහි ප්‍රියානිගෙ බෑගය තබා තමාට අසුන වෙන්කොට තබා ගන්නා ලෙස කීවේය.

ආනන්ද ශාලාවෙන් එළියට බැස්සේ මෙහි සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීම පිණිසය. වයස අවු 18 ක් පමණ වන ඉතා කෙසඟ තරුණයෙක් ඔසවාගෙන එන අයෙක් ආනන්දගේ නෙත ගැටිණ. කිළිටි වී ගිය කමිසයත්, සරමත් ඔහුගේ දුප්පත්කම කියා පෑවේ ය. පාවහන් පැළඳ නොසිටි ඔහු දරුවා ශාලාවේ ඉදිරි පෙළ පුටුවක වාඩිකොට එළියට බැස්සේ ය. ඔහු ඉතා වටිනා අත් ඔරලෝසුවක් පැළඳ සිටි අතර ගෙල වටා රුපියල් ලක්ෂයක් පමණ වටිනා රන් දම්වැලක් ද තිබෙනු යන්තමට ආනන්ද දැක්කේය. දරුවට මොනව වෙලාද ආනන්ද ඔහුගෙන් ඇසීය. කටේ තිබුණ බුලත් කෙළ එළියට දැමූ ඔහු දරුව උපන් දා ඉඳන් ඇවිදින්න බෑ නොවැ මහත්තයෝ, ඒ මදිවට කතා කොරන්නත් බෑ. නොබලපු දොස්තර කෙනෙක් නෑ මහත්තයෝ යැයි ඉතා අහිංසක සිනාවක් පාමින් කීවේය.

**ඔයාගෙ රස්සාව මොකක්ද ආනන්ද ඇසීය.**

අපි ඉතිං කුඹුරු වැඩ කුලී වැඩ එහෙම තමා කරන්නෙ ඔහු පිළිතුරු දුන්නේ ය. ඔහුගේ දෑත් දෙපා දෙස හොරෙන් බැලූ ආනන්ද මොහු කුලී වැඩ හෝ කුඹුරු වැඩ කරන කෙනෙක් නොවන බව ප්‍රත්‍යක්ෂ කර ගත්තේ ය. ආනන්ද ගොස් එම දරුවා වාඩි වී සිටි අසුනට යාබද අසුනේ වාඩි වී දරුවාගෙන් නම ඇසීය. එහෙත් ඔහු කථන ආබාධයක් ඇත්තකු හෙයින් නම කියාග න්නට නොහැකි විය. ඔහුගේ සාක්කුවේ තිබූ හැඳුනුම්පත ඉල්ලාගත් ආනන්ද එහි දෙපැත්තේම ඡායාරූප තමාගේ කැමරාව සහිත දුරකථනයෙන් ලබා ගත්තේය. අනතුරුව දරුවාගේ ද ඡායාරූපයක් ගත් ඔහු ප්‍රියානි අසලට විත් අසුන් ගත්තේ ය.

දේවගැතිතුමා තම දේශනය අරඹමින් දෙවියන් වහන්සේ ඉර, හඳ, තාරුකා, මහපොළොව, ගස්, ගල්, සතුන් හා මිනිසා මැවූ සැටිත් නොමඟ ගිය මිනිසා යහමඟට ගැනීමට ස්වකීය පුත්‍රයාණන් මෙලොවට එවූ සැටිත් ගැන සරලව විස්තර කළේය. වැඩිදුරටත් අදහස් දක්වමින් එතුමෝ මා පුංචි උදාහරණයක් කියන්නම්. එක් දිනෙක ජර්මන් ජාතික අඹුසැමි යුවළක් තම පො ක්ස්වැගන් වර්ගයේ මෝටර් රථයේ නැඟී ගමනක් යන්නට පිටත් වුණා. අතර මඟදී මෙම රථය ක්‍රියා විරහිතව මහමඟනතර වුණා. එවිට සැමියා ටික දුරක් ඇවිද ගොස් වාහන ගරාජයක කාර්මිකයකු කැඳවාගෙන ආවා. ඔහු සෑහෙන පමණ වේලාවක් දෝෂය නිවැරදි කරන්නට උත්සාහ කළත් එය කිරීමට නොහැකි වුණා. ඉන් පසු රථයේ හිමිකරු වෙනත් ගරාජයකට ගොස් වෙනත් කාර්මිකයකු කැඳවාගෙන ආවා. පෙර පරිදිම ඔහුට ද එම දෝෂය නිවැරදි කිරීමට පුළුවන් වුයේ නැහැ. ඒ අවස්ථාවේ ඒ අසලින් තවත් මෝටර් රථයකින් වැදගත් පෙනුමැති මහත්තයෙක් පැමිණියා. ඔහු තම මෝටර් රිය නවතා මෙම ආබාධිත මෝටර් රථය අසලට විත් සිදුවී ඇත්තේ කුමක්දැයි



විමසුවා. එවිට වාහනයේ අයිතිකරු මෙය හදා ගැනීමට ඔහුගෙන් උදව් ඉල්ලූවා. එවිට ඒ මහත්මයා වාහනය පරීක්ෂා කොට ඉතා සුළු වේලාවකින් එම දෝෂය නිවැරදිකර දුන්නා. ඉන්පසු වාහනයේ හිමිකරු ඇසුවා ඔබ කවුද කියා. මා මෙම වාහන වර්ගයේ නිර්මාතෘවරයා යනුවෙන් ඒ මහතා කියා සිටියා. එබැවින් මෙම වාහන වර්ගයේ දෝෂ හා ඒවා නිවැරදි කරන ආකාරය තමා මැනවින් දන්නා බව හෙතෙම ප්‍රකාශ කළා.

එතකොට මනුෂ්‍යයා කියන්නේ දෙවියන් වහන්සේගේ නිර්මාණයක්. එතකොට මේ මනුෂ්‍ය ශරීරයේ ඇති වැරදි දෝෂ හදල දෙන්න පුළුවන් හොඳම කෙනා කවුද? දේවගැතිතුමා සභාවෙන් විමසීය.

**දෙවියන් වහන්සේ**

සභාවේ බොහෝ දෙනෙක් කිවූ අතර පොක්ස්වැගන් එක හදපු කෙනා යැයි එක් තලතුනා අයෙක් කීවේය. එයට සභාවේ සිටි කණ්ඩායමක් සිනහසුන අතර තවත් කණ්ඩා යමක් රවා බැලූහ. ඒ මහත්මයා අවබෝධයකින් තොරව තමාගේ දේශනයට සවන් දී ඇතැයි දේවගැතිතුමා කීවේය. වාහනය හදා දීමට ඉදිරිපත් වූ මහත්මයා කෙරෙහි වාහන හිමිකරු පූර්ණ විශ්වාසය තැබුවා සේ දෙවියන් වහන්සේ මඟින් තමන්ගේ ගැටලූ විසඳා ගැනීමට දෙවියන් වහන්සේ කෙරේ පූර්ණ විශ්වාසයක් ඇතිකර ගත යුතු බව දේවගැතිතුමා කීවේය.

කලින් උදාහරණයේ කාර්මිකයන් ගෙන්වා රථයේ දෝෂය අලූත්වැඩියා කිරීමට යෑම මේ ආබාධිතයන් වෛද්‍යවරුන් වෙත රැගෙන යෑම හා සමාන කළ හැකි බව ද හෙතෙම කීවේය. හොඳයි සියලූ දෙනාටම දෙවියන් වහන්සේගේ පිහිටයි දැන් අපි යාච්ඤා කරමු යැයි දේවගැතිතුමා කියත්ම බොහෝ දෙනා සාධුකාර දුන්හ. මින් පැමිණ සිටින වැඩි පිරිසක් බෞද්ධයෝ බව ආනන්දට තේරුම් ගියේය. ප්‍රියානිද දෑත ඔසවා සාධුකාර දෙන්නට සැරසෙද්දී දෑත් පහළට නැම්ම වූ ආනන්ද ප්‍රියානි දෙස රවා බැලීය.

පැය භාගයක පමණ යාච්ඤාවකින් පසු

46 වන පිටට

